කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010
2012 ජනවාරි / පෙබරවාරි

මානවශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව - DMAT E2015

අපරදිග නාට්‍ය හා රංග කලාව

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

01. ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රභවය කෙරෙහි බලපෑ හේතු සාධක විමසන්න.

02. කථා වින්‍යාසය (Plot) යනු කුමක්ද? ඇරිස්ටෝටල් එය ට්‍රැජඩියක සෙසු අංගවලට වඩා වැදගත්කොට සැලකුවේ කවර හෙයින්ද?

03. ග්‍රීක ට්‍රැජඩි නාට්‍යවල ගායන වෘන්දය ඉටුකරන කාර්යය නිදසුන් මගින් පැහැදිලි කරන්න.

04. රෝම නාට්‍ය කෙරෙහි ග්‍රීක නාට්‍යකරුවන්ගේ ආභාසය කෙසේ වී දැයි ප්ලෝටස්ගේ නාට්‍ය ඇසුරෙන් විමසා බලන්න.

05. රෝම කොමඩි නාට්‍යකරුවෝ හාස්‍ය ජනනය සඳහා යොදාගත් උපක්‍රම කවරේ දැයි විචාරාත්මකව විමර්ශනය කරන්න.

06. මධ්‍යකාලීන යුරෝපීය ජනවන්දනා නාට්‍යවල වස්තු විෂය හා ඒවා රඟ දැක් වූ ආකාරය විස්තර කරන්න.

07. ආගමික සංකල්ප නාට්‍යානුසාරයෙන් සාර්ථක ලෙස ඉදිරිපත් කිරීමට 'සකලජන' (Everyman) නාට්‍යකරුවා යොදා ගෙන ඇති උපක්‍රම කවරේද?

08. හැම්ලට් නාට්‍යයේ මූලික තේමාව පැහැදිලිකර එම තේමාව ඉස්මතු කරලීමට හැම්ලට් කුමාරයාගේ චරිතය ඉවහල්වන ආකාරය පරීක්ෂා කරන්න.

09. විලියම් ෂේක්ස්පියර්ගේ නාට්‍ය ප්‍රභේද විග්‍රහ කොට ඒවායේ විශේෂතා සාකච්ඡා කරන්න.

********************************